# 03. පාඩම ධර්ම රත්නයේ ගුණ

| ධර්ම රත්නයේ<br>. .      ගුණය | අරුත |
|---|---|
| ස්වාක්ඛාතෝ භගවතා ධම්මෝ | බුදුන් වහන්සේ විසින් දේශනා කරන ලද ධර්මය<br>මුල, මැද, අග යන්න තුන් තැන්හි ම යහපත් වේ .<br>එහි සැකකටයුතු දේ හෝ අනුමාන හෝ කිසිවක් නොමැත .මනාව අවබෝධ කොටගෙන දේශනා කරන ලද උතුම් වූ සත්‍යය බුදුන් වහන්සේ වදාළ ධර්මයයි .එබැවින් එම ධර්මය ස්වාක්ඛාත නම් වේ |
| සන්දිට්ඨිකෝ | ධර්මය පිළිපදින සත්පුරුෂයෝ තම තමන්ම ප්‍රතිඵල අත් දකිති.ලෝභ ,දෝෂ ,මෝහ දුරු කොට සෝවාන් ආදී මාර්ග ඵල මාර්ගඵල මෙලොවදීම උදා කර ගනිති .තමාට මෙලොවදීම දැක ගත හැකි බැවින් ධර්මය සන්දිට්ඨික නම් වේ. |
| අකාලිකෝ | ධර්මය මනාව ප්‍රගුණ කරන්නාට සතියකින්, මාසයකින් ,වසරකින් හෝ ඊළඟ භවයේදී හෝ නොව ඒ මොහොතේදීම ප්‍රතිඵල ලැබිය හැකිය.<br>එම නිසා ධර්මය අකාලික නම් වේ . |
| ඒහිපස්සිකෝ | ඕනෑම කෙනකුට ධර්මය පිළිබඳ විමසා බැලිය හැකිය . මෙහි රහසක් හෝ සැඟ වූ කිසිවක් හෝ නැත .ධර්මය වෙත එළඹ පිළිවෙත් පුරන්නට ප්‍රතිඵල ලැබීම නිසැකවම සිදුවේ .ඇවිත් බලන ලෙස නිර්භයව ප්‍රකාශ කළ හැකි නිසා ධර්මය ඒහිපස්සික නම් වෙයි . |
| ඕපනයිකෝ | තමාගේ වෙනත් කටයුතු සියල්ල පසෙකින් තබා සිතට නගා ගැනීමට සුදුසු බැවින් ධර්මය ඕපනයික නම් වේ |
| පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤූහී | දහම නුවණැත්තන් විසින් තමා ම වෙන වෙනම අවබෝධ කරගත යුතුය . තමාගේම නුවණින් තමාගේම අත්දැකීමක් බවට පත් කරගත යුතුය.එබැවින් ධර්මය පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤූහී නම් වේ. |